අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

**2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පවතින අධ්‍යක්ෂ ජනරාල් තනතුර (කොන්ත්‍රාත් පදනම) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. අධ්‍යක්ෂ ජනරාල් (කොන්ත්‍රාත් පදනම) HM 2-3 (තනතුරු 01)

**සුදුසුකම් හා පළපුරුද්ද :**

නීතිය, පරිපාලනය හෝ අපරාධ විද්‍යාව යන ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම

සමග

අදාල විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ අදාල රාජ්‍ය නොවන හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක් ලබා තිබීම (අවම වශයෙන් මින් වසර 05ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ (HM) විය යුතුය)"

**වයස් සීමාව**

අවු : 35 ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :**

HM 2-3 - 2016 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර අදාල වේ. රු. 98,215.00+ ජීවන වියදම් දීමනාව (රජයේ විශ්‍රාම වැටුප් ලබන නිලධරයෙකු මෙම තනතුර සඳහා පත් කරනු ලබන්නේ නම් එම නිලධරයාට විශ්‍රාම වැටුප සමග නියමිත ජීවන වියදම් දීමනාව ලැබෙන අතර, මෙම තනතුරට නැවත පත් කිරීම යටතේ විශ්‍රාම වැටුප සමග හිමිවන ජීවන වියදම් දීමනාවේ ඉතුරු කොටස ඔහු ලබන මාසික දීමනාව සමග ලබා දිය යුතුය.)

මෙම තනතුර සඳහා නිල රථයක් හෝ ඒ වෙනුවෙන් ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ තනතුරට චක්‍රලේඛ ප්‍රකාරව හිමි අනුමත අනෙකුත් දීමනා හිමිය.

**කොන්දේසි**

01. ඉහත සඳහන් අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමේදී සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, එහිදී පහත පරිදි ලකුණු ලබා දෙනු ඇත.

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| අනෙකුත් අදාල කාර්යය සාධනයන් හා කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| **මුළු ලකුණු ගණන** | 100 |

ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට (2024.08.09) මෙම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

02. සෑම ඉල්ලුම්කරුවෙක්ම
    I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
    II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
    III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
03. ඉහත සුදුසුකම් හා තනතුරට අදාල පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත්වල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.
04. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ඔබ දායක වනු ඇත.
05. අයදුම්කරුවන් විසින් අතිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.
06. අයදුම්පත් කැඳවීම අවසන් කරනු ලබන දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල පිටපත් ඉදිරිපත් කර නොමැති සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුලත් ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත සටහනක් සියලු සහතික පිටපත් සමග විද්‍යුත් තැපැල් මගින් chairman.napvcw@gmail.com හා ලියාපදිංචි තැපැලෙන්, සභාපති, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට 2024.08.09 දිනට ප්‍රථම ලැබෙන පරිදි යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය.

**සභාපති**
**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,**
**428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**දු. අංක. 0112879539**
**දිනය 2024.07.26**